පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 492

நிறுவனத்தின் பெயர் : நண்னடத்தை மற்றும் சிறுவர் பராமரிப்பு சேவைகள் திணைக்களம்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4)இன் கீழ் கௌரவ அமெச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 492

Name of the institution: Department of Probation and Child Care Services

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No: 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

ආයතනයේ නම - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
01. සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබිණි.	මේ වන විට අඩුපාඩු නිවැරදි කර ගනිමින් යාවත්කාලීනව පවත්වාගෙන යයි.
02. ලැබෙන චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබිණි.	මේ වන විට යාවත්කාලීන කර ඇත.
03. අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබිණි.	මේ වන විට එය සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
04. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මාසික් තුල පිළිතුරු සපයා නොතිබිණි.	මින් ඉදිරියට ලැබෙන සියළුම විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළත පිළිතුරු සැපයීමට කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
05. මු.රෙ.134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබිණි.	මෙම දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අතර විගණන වැඩසටහන් අමාත්‍යාංශ විගණන අංශය මගින් සකස් කරනු ලබයි. දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට 2025.08.18 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
06. 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය වක්‍රලේඛයේ I කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබිණි.	භාණ්ඩ සමීක්ෂණ වාර්තා සකස් කිරීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතින අතර ඉදිරියේදී නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
07. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌනතා පිළිබඳව වන නිර්දේශයද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබිණි.	පරිවාස දෙපාර්තමේන්තුව සතුව පරත්ත මධ්‍යස්ථානය උප කාර්යාලයක් ලෙස පැවතීමත් එය ප්‍රධාන කාර්යාලයෙන් දුරස්ව වෙනත් ස්ථානයක පිහිටා තිබීමත් පරත්ත මධ්‍යස්ථානයෙන් ඉවත් කළ යුතු භාණ්ඩ අපහරණ කටයුතු හා ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුල ඇති ඉවත් කළ යුතු භාණ්ඩ එක් දිනක එක් ස්ථානයක සිදු කිරීම වඩා සුදුසු යැයි තීරණය කිරීම නිසා මෙලෙස ප්‍රමාදයක් සිදු වී ඇත. නියමිත කාල වකවානුව තුල කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

08. සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබිණි.	2024.01.19 දින එවකට කාන්තා හා ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ අංශ ප්‍රධාන රැස්වීමේදී සාකච්ඡා වූ කරුණකි. නැවත 2024.04.04 රැස්වීමේදී කරුණු අංක 07 යටතේ සාකච්ඡා වී ඇත. මෙහිදී අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදනය කළ පසු එම තීරණය මත පදනම්ව දෙපාර්තමේන්තු වාහන සඳහා ද ඒ ආකාරයෙන් ස්ටිකර් මුද්‍රණය කර වාහන බඳෙහි ඇලවීමට කටයුතු කර ඇත. රාජ්‍ය ලාංඡනය ස්ටිකරයක් ලෙස බඳෙහි අලවා තිබීම මත වාහන සේදීමෙන් එම ස්ටිකරය ක්‍රමක්‍රමයෙන් ගැලවී ගොස් ඇත. එබැවින් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව මගින් 2025 වර්ෂයේදී වාහනවල රාජ්‍ය ලාංඡනය හා දෙපාර්තමේන්තු නාමය බඳ දෙපස පින්තාරු කර ඇත. අලුත්වැඩියාවට ලක්කර 2026 වර්ෂයේ පින්තාරු කිරීමට නියමිත KE 9230 මෝටර් කාර් රථයද පින්තාරු කිරීමෙන් පසුව රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව මඟින් රාජ්‍ය ලාංඡනය හා දෙපාර්තමේන්තු නාමය පින්තාරු කිරීමට කටයුතු කරනු ලැබේ.
09. මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබිණි.	මු.රෙ. 371 ප්‍රකාරව අදාල කාර්ය අවසන් කර දින 10 ක් තුල නැවත පියවනු ලැබේ. ප්‍රායෝගික හේතු මත එසේ පියවී නැති අවස්ථා කිහිපයක් නිරීක්ෂණය විය. (2025 වර්ෂයේ අවස්ථා 02 ක් පමණ) නියමිත දිනට අත්තිකාරම් පියවන ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇත.
10. ආයතනයේ විගණන මතය යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	තත්ත්වාගණනය කළ මතයක් වේ.
11. විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	ඇමුණුම් i හි සඳහන් කර ඇත.
12.රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කර නොතිබිණි.	ඇමුණුම් ii හි සඳහන් කර ඇත.
13.සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබිණි.	ළමා හිමිකම් ප්‍රවර්ධන නිළධාරීන් (භෘතියික මට්ටමේ මාණ්ඩලික නිළධාරීන්) හා දෙපාර්තමේන්තුවේ සියලුම මාණ්ඩලික නිළධාරීන් වෙත දැනුම් දී 2024 වසරේ සිට වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීම සිදු කෙරේ.

.....

සරෝජා සාවිත්‍රී පෝල්රාජ්

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය

12. විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

විගණන නිරීක්ෂණ	නිර්දේශ	වර්තමාන ප්‍රගතිය
1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු **මූලධන වියදම්** 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණු පිරිවැය රු.2,350,000ක් වූ UNCRC දත්ත පද්ධතිය මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	දත්ත පද්ධතියේ වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.	2024 වර්ෂයේදී නිවැරදි අයුරින් ගිණුම්ගත කර ඇත.
2. මූල්‍ය සමාලෝචනය **2.1 වියදම් කළමනාකරණය** දෙපාර්තමේන්තුව විසින් නිසි පුරෝකථනයකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන්, වැය විෂයයන් 4ක ප්‍රතිපාදන වලින් මුදල් රෙගුලාසි 66 මඟින් සියයට 40 සිට සියයට 83 අතර පරාසයක මුදල් වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබුණි. තවද වැය විෂයයන් 4ක ප්‍රතිපාදන වලින් සියයට 54 සිට සියයට 95 අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	නිසි පුරෝකථනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය.	ඇස්තමේන්තු සකස් කිරීමේදී නිසි පුරෝකථනයකින් යුතුව ඇස්තමේන්තු සකස් කරනු ලැබේ.

2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්. දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්,එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මෙම තත්ත්වය නිවැරදි කරන ලදී. 2025 මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේදී 2018 අංක 19 දරන විගණන පනතේ 38 (1)(ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරන ආයතන තුල පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදු කරන බවත් සහතික කරන ලදී.

3. මෙහෙයුම් සමාලෝචනය 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම (අ) 2019 සිට 2023 දක්වා කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලාංකික දරුවන් විදේශ රටවලට දරුකමට හදාවඩා ගැනීම සඳහා 32 දෙනෙකු ලබා දී තිබුණ ද විදේශ හදාවඩා ගැනීම් ආඥා පනතෙහි 10C වගන්තිය අනුව හදාවඩා ගැනීම සඳහා ලබා දුන් දරුවන් පිළිබඳව අවුරුදු 10 ක් යන තෙක් අඛණ්ඩව පසුවිපරම් වාර්තා ලබාගෙන නොතිබුණි.	විදේශ හදාවඩා ගැනීම් ආඥා පනතට අනුකූලව කටයුතු කළ යුතු අතර හාර දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.	විදේශ හදාවඩා ගැනීමට ලබා දෙන දරුවන්ගේ ප්‍රගති වාර්තා විධිමත් පරිදි ලබා ගැනීමට නව ක්‍රමවේදයන් හඳුන්වා දී ඇති අතර ඒවා ක්‍රියාත්මක කර ඇත. 1.විදේශයන් සඳහා හදාවඩා ගැනීමට ලබාදුන් දරුවන්ගේ ප්‍රගති වාර්තා සඳහා දත්ත පද්ධතියක් සකස් කර ඇත. 2.දරුවා හදාවඩා ගැනීමට පැමිණෙන ඉල්ලුම්කරුවන් වෙත ප්‍රගති වාර්තා එවිය යුතු දිනයන් සඳහන් කරමින් උපදෙස් මාලාවක් ලබාදීමට නව ක්‍රමයක් හඳුන්වා දී ඇත. 3.ප්‍රගති වාර්තා ලද පසුව එය ගොනුවේ සඳහන් කර ඉල්ලුම්කරුවන් වෙත ලිඛිතව ඉදිරි දිනයන් දැන්වීමට පියවර ගැනීමට නව ක්‍රමයක් හඳුන්වා දී ඇත. 4.මෙතෙක් ප්‍රගති වාර්තා එවීමට ප්‍රමාද වී ඇති විදේශීය රටවල දෙමාපියන්ට නැවත සිහිකැඳවීම් යැවීමට පියවර ගෙන ඇත.

(ආ) 1939 අංක 38 දරණ ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත වසර කිහිපයක සිට සංශෝධනය කරමින් පැවතිය ද සමාලෝචිත වර්ෂ අවසානයටත් එම ආඥා පනත සංශෝධනය අවසන් කර නොතිබුණි. තවද, 1941 අංක 24 දරණ දරුවන් හදාවඩා ගැනීමේ ආඥා පනත කාලීන අවශ්‍යතාවයට ගැළපෙන ලෙස සංශෝධනය කර නොතිබුණි.	ආඥා පනත් ඇතුළු නීති අවශ්‍යතාවයට ගැලපෙන ලෙස සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය.	ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනතේ අත්‍යවශ්‍ය වන කොටස් කිහිපයක් ඇතුළු කොට සංශෝධනය කරමින් 2024 අංක 39 දරණ "ළමා පනත" සකස් කරන ලදී. මෙම ළමා පනත හා දරුවන් හදාවඩා ගැනීමේ ආඥා පනත කාලීන අවශ්‍යතාවයට ගැළපෙන ලෙස සංශෝධනය කිරීමට අධිකරණ අමාත්‍යාංශය විසින් කමිටු 2ක් පත් කර ඇත.
3.2 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ළමා නිවාස 9 ක් අලුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 5 ක් වෙන් කර තිබුණද 2023 වර්ෂය අවසානය වන විටත් රු.මිලියන 2.1 ක් පමණ වියදම් කර ළමා නිවාස 4 ක් පමණක් අලුත්වැඩියා කර තිබුණි. ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 44 ක් අවම මට්ටමක පැවතුණි.	වාර්ෂික අයවැය ප්‍රතිපාදන නිවැරදිව වෙන් කරවා ගැනීමට කටයුතු කළ යුතුය.	ඉදිරි වර්ෂය සඳහා නිසි පූරෝකථනයකින් යුතුව ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු යොදා ඇත.
3.3 විදේශ ආධාර ව්‍යාපෘති ළමා සංවර්ධන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ UNICEF මූල්‍යාධාර ලෙස ලැබුණු රු.35,875,000 ක මුළු ප්‍රතිපාදනයෙන් රු.14,525,271 ක් පමණක් වැය කර තිබීම හේතුවෙන් රු.21,349,728 ක එනම් සියයට 60 ක ඉතිරියක් පැවතුණි.	විදේශාධාර උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි අයුරින් කාර්යක්ෂමව වැය කළ යුතුය.	කාර්යක්ෂමව උපරිම ඵලදායීතාවයකින් යුතුව වැය කිරීමට සැලසුම් කර ඇත.

3.4 වත්කම් කළමනාකරණය අපයෝජනයට ලක්වෙන දරුවන්ට පුහුණුව ලබාදීම තුළින් සමාජගත කිරීම සඳහා වන පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය සහ ජාතික පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථාන 2 ක 2023 ජුනි 06 දින නැවත පවරා ගනු ලැබුවද භෞතික සම්පත් හා අවට පරිසරය යථා තත්ත්වයට පත් කර පුහුණු හා උපදේශන සේවා සැපයීම සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. (ආ) දෙපාර්තමේන්තුවට අයත් ජාතික පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානයේ නිලධාරින් 60 දෙනෙකුට පමණ පුහුණුවීම් සිදුකළ හැකි වායුසමීකරණය කළ සියම පහසුකම් සහිත දේශන ශාලා 2 ක් නිශ්කාර්යව පැවතුණි.	ළමා පුහුණු හා උපදේශන සේවා මධ්‍යස්ථානය යථා තත්ත්වයට ගැනීම සඳහා කඩිනමින් අලුත්වැඩියා කටයුතු සිදුකර ගැනීමට පියවර ගත යුතුය. කඩිනමින් අලුත්වැඩියා කටයුතු සිදුකර මධ්‍යස්ථානය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	. 2027 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන ලබාගැනීමට අයවැය ඇස්තමේන්තු තුලට ඇතුලත් කර ඇත.
4.මානව සම්පත් කළමනාකරණය දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර 2024 අගෝස්තු මාසයේ සිටද පරිවාස නිලධාරී තනතුර 2017 වර්ෂයේ සිට ද පුරප්පාඩුව පැවතුණි.	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනිමට අත්‍යවශ්‍ය වන තනතුරු පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය.	පරිවාස නිලධාරී තනතුර සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් 2026.07.12 දින බදවා ගැනීමේ විභාගය පවත්වන ලදි.එහි ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීම ඉදිරියේදී සිදුකරනු ලැබේ. නීති නිලධාරී තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ නමුත් අදාළ සහතික පත්‍රවල NVQ මට්ටම සහ උසස් අධ්‍යාපන මට්ටම සනාථ කර එවන ලෙස දන්වා එවා ඇත.ඒ අනුව සනාථ කර ගැනීමට අදාළ ආයතන වෙත යොමු කළ අතර,කොළඹ විශ්ව විද්‍යාලයෙන් පමණක් මේ වන තුරු සනාථ කර එවා නොමැත. එබැවින් ඒ පිළිබඳව සිහිකැඳවීම්ද සිදු කර ඇති අතර සහකාර කොමසාරිස් (පාලන) විසින් විශ්ව විද්‍යාලයේ රෙජිස්ට්‍රාර් හමුවී කඩිනමින් එම කාර්යය ඉටු කර දෙන ලෙස දන්වා ඇත.

12.රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ

විස්තරය	කාරක සභාව ලබාදුන් නියෝග	වර්තමාන ප්‍රගතිය
1.විගණන කෙටි සටහන් ඡේද අංක 1.5- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණකවරයෙකු හා විගණන කමිටුවක් නොමැති බව.	2023 ජූලි 25 දිනට පෙර අභ්‍යන්තර විගණන කමිටුවක් ස්ථාපිත කර කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ ග.නි වෙත නියෝග කළේය.	තනතුරු අනුමැතිය හා අදාළ ගැටළු සම්බන්ධව 2026.07.03 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී මෙම තනතුර අනුමත කළ හැකි බව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් වාචිකව ප්‍රකාශ කරන ලදි. 2023.07.14 දින විගණන කමිටුව පත් කර ඇති අතර මේ වන විට එය ක්‍රියාකාරී මට්ටමක පවතී. අදාල වාර්තාව 2023.07.20 වන දින කාරක සභාව වෙත යවා ඇත.
2. විගණන කෙටි සටහන් ඡේද අංක 1.12- රු.2,350,000 ක පමණ පිරිවැයක් දරා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් කමිටුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත පවරන ලද UNCRC දත්ත පද්ධතිය ප්‍රයෝජනයට නොගැනීම.	අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් මෙම දත්ත පද්ධතිය ක්‍රියාත්මක කරන දින වකවානු ඇතුළත් වාර්තාවක් 2023.08.08 දිනට පෙර කාරක සභාවට ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කළේය.	අදාල වාර්තාව 2023.08.07 වන දින කාරක සභාව වෙත යවා ඇත. මේ සම්බන්ධව කමිටුවක් පත් කළ අතර අදාල කමිටුවේදී ජාතික බුද්ධිමය දේපල කාර්යාංශයේ අධ්‍යක්ෂ විසින් මෙම දත්ත පද්ධතිය සම්බන්ධව අධ්‍යයනයක් සිදු කර මොරටුව හෝ කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයන ආයතනය මඟින් උපදේශන සේවාවක් ලබාගෙන දත්ත පද්ධතිය සංවර්ධනය කළ හැකිදැයි සොයා බැලිය යුතු බවත් නමුත් ඒ සඳහා උපදේශක ගාස්තු ගෙවීමට සිදුවන බවත් දන්වා ඇත. එහිදී තවදුරටත් මේ වෙනුවෙන් වියදම් දැරිය යුතු බැවින්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයෙන් සහාය ඉල්ලා සාකච්ඡා සිදු කර ඇති අතර වෙනම දත්ත පද්ධතිය සංවර්ධනය කරනවා වෙනුවට අමාත්‍යාංශය ඩිජිටල්කරණ වැඩපිළිවෙල යටතේ අදාල අවශ්‍යතා ඇතුළත් කිරීම සුදුසු බව සාකච්ඡා වී ඇත. ඒ අනුව ඩිජිටල් අමාත්‍යාංශය මඟින් සංවර්ධනය කිරීමට නියමිත දත්ත පද්ධතිය හරහා මෙම අවශ්‍යතාවයද දෙපාර්තමේන්තුවේ යෝජනාවක් ලෙස දක්වා ඇත.